කරගත හැකිවූයේ, ඔවුන් සියලුදෙනාම එක්ව එය දෙතුන්වරක් තල්ලු කිරීමෙන් පසුවය.

"අප්පා දූවිලි....." මහීකා නැහැය අතින් වසා ගත්තාය." මට හුස්ම ගන්නත් බැහැ...."
"ඊට හපන් මකුළු දැල්....." අමා තමාගේ මුහුණෙහි හැපුනු තඩි මකුලු දැලක් ගලවමින් කීවාය.

රිදීමා වටපිට බලනු ඔවුනට පෙනිණි.

"මේක ටිකක් සුද්ද බුද්ද කරලා හිටියොත් හොඳ නැද්ද ?" මහීකා විමසුවාය. "නැත්නම් මුකුත් හොයාගන්න එක බොරු...."

"පිංචි කෙල්ලට කතා කරමුද ?" අමා ඇසුවාය.
"ඒක නම් හොඳ අදහස...." රිදීමා එකඟ වූවාය.

ඈ පහලට නැමී, තරප්පි වැටට දෙතුන්වරක් තට්ටු කළාය. තරප්පියට යටින්, සුදුමැලි මුහුණක් එබිකම් කරනු පෙනිණි. රිදීමා, පිංචි කෙල්ලට උඩට එන්නැයි අතින් සන් කළාය.

"මාර ඩිටෙක්ටිව් වැඩ තමා තිබිලා තියෙන්නේ !" මහීකා තමාටම කියා ගත්තාය.

"ඕක ඉස්සර කාලේ ඉඳන් කරපු දෙයක් වෙන්න ඕනි....."

පිංචි කෙල්ල උඩට දුව ආවේ පිම්මට දෙකටය.

"හොඳ ප්‍රැක්ටිස් එකකුත් තියනවා පිංචිට" මහීකා, පිංචිගේ පිටට පහරක් ගසමින් කීවාය. පිංචි ඇස් ලොකු කරගත්තාය.

"හා ! හා ! ගනින් අර මුල්ලේ තියෙක කොස්ස. මේක පොඩ්ඩක් පිහදලා දාපං" අමා විධානය කළාය.

පංචි කෙල්ල විනාඩියට, දෙකට දූවිලි ටික මුල්ලකට තල්ලු කළා. ගවොමට උඩින් හැඳ සිටි චීත්ත කෑල්ලෙන් මකුලු දැල් හා පොඩි පහේ සටනක් ද කළාය.

"අර තියෙන්නේ...."

රිදීමා කොනක වූ පෙට්ටගමක් පෙන්වූවාය. කුඩා වා කවුළුවක් අද්දරට වෙන්නට එය තල්ලු කොට තිබුණේය.

"අර ජනේලය ඇරලා දාපං පිංචි..." අමා කුඩා කවුළු දෙකතුනක්ම පිංචිට පෙන්වූවාය. පිංචි විවර කළ කවුලු තුලින්, මල් සුවඳ මිශ්‍රිත සිහින් සුලං පොදක් ඇතුලට ගලා ආවේය. යාන්තම් හුස්ම ගැනීමට හැකිවූවාක් මෙන් මහීකාට දැනිණි.

රිදීමා පෙට්ටගම ඉදිරියෙන් දණ ගසා ගත්තාය. එහි ඇදුණු යෙහෙළියෝ මාරුවෙන් මාරුවට රිදීමා දෙසද, පෙට්ටගම දෙසද බැලුවෝය. පිංචිද හෙමිහිට ඒ වෙත ලංවූවාය. ඇගේ දෑසේ ප්‍රමාණය දුටු මහීකාට බියක්ද දැනුණේය.

"මොනවද යෝදියේ ඔච්චර ඇස් පළල් කරගන බලන්නේ ?"

පිංචි කෙල්ලගේ සුරත දිගු වූයේ බිත්තියෙහිවූ පින්තූරයක් වෙතටය. යෙහෙළියෝ ඒ දෙස බැලුවාහ. මහීකාට උඩට ගත් හුස්ම පහළට දාගත නොහැකි වූයේය.

"මේ ඉන්නේ සුදුමැණිකේ !" පිංචි කීවාය.

**ළබන කලාපයට**

26 වන පිටෙන්

## හද රිදවන මතක සුවඳ

යනකොටත් මෝචරියේ රෙස්පොන්සාබිල (භාරව සිටින්නා) කිව්වා," ඔයාලා කැමති නම් බොඩිය බලන්න. හැබැයි බලනවාට වැඩිය හොඳයි යාළුවගේ ජීවමාන රූපය ඒ විදියට හිතේ තියාගෙන ඉන්න එක කියලා"

මා ළඟට පැමිණි පුෂ්පසිරි මිත්‍රයා පැවසී ය. අඟුරු වෙන්නට පිච්චී ඇති කුලේගේ සිරුර නොබලන්නට මම හිත හදා ගතිමි. කුලේගේ මරණය සිදුවන විට නතරවී සිටියේ ඔහුගේ මිත්‍රයෙකුගේ කාමරයේ ය. එය පැරීසියේ වැදගත් විදියට ජීවත්වන මිනිසුන් වෙසෙන වැදගත් පෙනුමක් ඇති ගොඩනැගිල්ලක පිහිටි කාමරයකි. එම කාමරයේ නතර වී උන් කුලේගේ මිත්‍රයා සේවය කළේ වෛද්‍යවරයෙකුට ය. වෛද්‍යවරයාගේ නිවස ද, පෞද්ගලික ඩිස්පැන්සරිය ද මේ කාමරය ද පිහිටා තිබුණේ එකම නිවසක් ලෙස ය. මේ අවිවාහක වෛද්‍යවරයා තම මිතුරු සේවකයා හමුවන්නට එන මිතුරන් සමඟ ද මිත්‍රශීලි ලෙස කථාබහ කරන සමාජශීලි පුද්ගලයෙකි.

මෙම සිදුවීම සිදුවන්නේ කුලේගේ මිත්‍රයා එම කාමරයේ නිදා නොගත් රාත්‍රියක ය. ගිනි නිවන හමුදාවට ගින්න නිවාගත හැකිවුයේ ගිනිජාලාව කුලේ සිටි කාමරය දවා අළුකර ඉහළ මාලයටත් පැතිරෙමින් තිබියදී ය.

කාමරය තුළ ගින්න හටගත්තේ කෙසේද ? ගින්නට ගොදුරු වු පුද්ගලයා මේ තරම් පිච්චී කරවුයේ කෙසේද ? ආදී උභතෝකෝටික ප්‍රශ්න රැසක් මේ අභිරහස් මරණය සම්බන්ධයෙන් පැන නැගුණි.

විදුලිය කාන්දුවීමකින් වැනි යමකින් ගින්න හටගෙන පළමුව කාමරය පිච්චී එයින් නැගෙන දුමාරයක් විසඳු වන පුද්ගලයා පසුව පිච්චුනේ නම් මෙතරම් කරවෙන තුරු පිච්චීමට කාලයක් නැත.

පුද්ගලයා කාමරයේ මැද බුමුතුරුණ මතදී සිරුරට ගිනිතබා ගත්විට පළමුව ඔහු දැවී පිච්චී පසුව කාමරය පුරා ගින්න පැතිරී ජනේලයෙන් පිටතට ගිනිදළු කඩා පනින්නට ඇත. ගිනි නිවන හමුදාව පැමිණෙන්නේ එයින් පසුවය. එම නිසා මෙය අත්වැරදීමකින් හෝ අහම්බෙන් සිදුවුවකට වඩා සියදිවි හානි කර ගැනීමක් විය හැකිය. කුලේගේ මරණය සම්බන්ධයෙන් අපහට දැනගත හැකිවුයේ ඉහත සඳහන් නිගමන කිහිපයකි.

මා තුළ මෙන්ම බොහෝ දෙනෙකුගේ සිත්හි පැන නැගුණු ප්‍රශ්නයක් වුයේ තමාට නවාතැන් දුන් මිත්‍රයා ද අමාරුවේ වැටෙන පරිදි කුලතුංග වැනි සාමකාරී, අනුන්ට හිරිහැරයක් නොකරන මිනිසකු මෙවැනි පියවරක් ගත්තේ මන්ද යන්නය.
"පේර්ලා ෆේස්" සුසාන භූමිය ඓතිහාසික ස්මාරක හා සොහොන් ගැබ් වලින් යුතු අතිවිශාල එමෙන්ම සුන්දර උද්‍යානයක් බඳු තැනකි. 'පැරිස් කොමියුනයේ' සිහිවටන ස්මාරකය පිහිටුවා ඇත්තේ ද මෙහි ය.

දින කිහිපයක් වට වැස්සෙන් පොළොව පෙඟී බරිත ව තිබු එක් අපරභාගයක විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් කුලේගේ දැවී අඟුරු වු දේහය මිහිදන් වුයේ මෙම සොහොන් බිමෙහි ය. අභිරහස් ලෙස සිද්ධි වු මරණයක් නිසා නැවත පරීක්ෂණයකට අවශ්‍ය වුවහොත් යන පදනම යටතේ මළසිරුර මිහිදන් කරනු ලැබී ය.

කුලේට අවසන් ගෞරව දැක්වියයුතු විශේෂ පිරිසක් කලින් ගත් තීරණයක් අනුව මෙන් ඔහුට අවසන් ගෞරව දැක්වීමට මෘතශරීරාගාරයට හෝ සුසාන භූමියට නොපැමිණියහ. ජ.වි.පෙ. පැරිස් කමිටුවට සම්බන්ධ සහෝදරවරුන් එම පිරිසයි.
කුලේ මට දුන් ගිටාරය, මා අභයගුණගේ නිවසේ සිට රැවුල් කිංස්ලිගේ කාමරයට යන විටත්, එතැනින් ඉවත්ව පැරිසියෙන් තරමක් ඈත ප්‍රදේශයක් වු 'ගාෆ් සාර්සෙල්' හි සිටි මිතුරන්ගේ කාමරයට යන විටත්, පසුව මගේ බිරිඳ හා දරුවා ප්‍රංශයට පැමිණි කල පැරිස් 17 පදිංචියට යන විටත්, නැවතත් පදිංචිය මාරුකර ප්‍රංශයේ 93 වැනි දෙපාර්තමේන්තුවේ නිවසකට පැමිණි විටත්. එතැනින් එම ප්‍රදේශයේම වු මගේම නිවසකට පදිංචියට යන විටත් රැගෙන ගියෙමි. එය අදටත් මගේ පොත් රාක්කය මත තැන්පත් කර තිබේ. ගිටාරය දකින සෑම වරෙකම මට කුලේ සිහිපත් වෙයි. ගිටාරය අතට ගෙන එය වැයු කාලයක් මට මතක නැත. මට එහි තත් හඬවන්නට සිත් නොදෙයි.

**ළබන කලාපයට**

Looking for
accommodation
in Sri Lanka during
ICC World Cup 2011?

Staying at Ethara residencies is similar to having your own little holiday home in the heart of Rajagiriya, Colombo. Tucked in amongst nature away from the busy City, you'll have peace, privacy and space. Ethara residency is found in our own three story house where you have the whole top floor to yourself. For US $75 per night you will have:

- A highly secure holiday home for families with children or a group of friends under the care of our resident manager.
- 3 large bedrooms - 4 to 5 people can sleep, two bathrooms with hot water, Tea/coffee making facility, veranda, large balcony with nice view and lots of natural air and light.
- Gas Stations, Banks, Post Office, Cargils and Keells super markets, KFC, Pizza Hut, McDonald's, Perera & Sons, Barista and many other restaurants within easy access.
- 2 TVs and a selection of English novels for your entertainment.

**Please email dates of your stay to**
**etthararesidencies@hotmail.com and prepay US$ 75 per day for all 3 rooms to book this great family holiday home.**

**For more details contact**
**Shiroma on +9411 286 9518, +9477 220 2100 or**
**Call Uditha 0422 672 484 after 7pm**



කොතැන සිටියත් සූරිය ඔබේ වෙළඳසලයි

**කාන්සියට, රස වින්දනයට සිංහල ටෙලි නාට්‍ය**

**බටහිර ඔස්ට්‍රේලියාව, දකුණු ඔස්ට්‍රේලියාව, තස්මේනියාව,**
**ක්වීන්ස්ලන්තය, නිව් සවුත් වේල්සය, කැන්බරා, වික්ටෝරියා**
**ඔස්ට්‍රේලියාවේ කොයි අස්සක මුල්ලක හිටියත්**
**ඔබට අවශ්‍ය සිංහල ටෙලි නාට්‍ය**
**තැපෑලෙන් ගෙන්වා ගන්න...**

**අප අමතන්න**
**03 9465 8257**

සූරිය
Sooriya
ඔබේ වෙළඳ සල

* conditions apply

132 - 1B Alexander Av Thomastown Vic 3074 Tel - 9465 8257
**www.sooriya.com.au**

සූරිය - හිරු මෙන් විශ්වාසයි




"පමා නොවී එම් අකුරට" මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න.

*සංස්කාරක*